# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2404/19 - 2024 ඔක්තෝබර් මස 02 වැනි බදාදා - 2024.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් මෙම නියමය මගින් පනවමි.

**උපලේඛනය**

| *I වන තීරය* | | | | *II වන තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං.ව. ශීර්ෂය | සං.ව. සංකේතය | විස්තරය | |
| 1. | 07.01 | 0701.90 | අනෙකුත් - අර්තාපල් | කි. ග්‍රෑමයට රු.60/- |
| 2. | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි. ග්‍රෑමයට රු.30/- |

මෙම නියමය, 2024 ඔක්තෝබර් මස 03 වැනි දින සිට 2024 නොවැම්බර් මස 30 වැනි දින දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, අර්තාපල් (රේගු සංකේතාංක 0701.90) ආනයනය කිරීමට අදාළව 2024.01.07 දිනැති අංක 2365/84 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත්කළ නියමය සහ අංක 2360/52 දරන 2023.11.30 දිනැති *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් බී ළූණු (රේගු සංකේතාංක 0703.10.20) සඳහා පනවා ඇති නියමය, 2024 ඔක්තෝබර් මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 02 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ දී ය.

EOG 10- 0061


1A - PG 6897 — 429 (2024/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.